19.	194	යෞවන හා ක්‍රීඩා අමාත්‍යාංශය	ගමන් වියදම්, ලිපි ද්‍රව්‍ය, සන්නිවේදන සහ අනෙකුත් පුනරාවර්තන, කාර්ය මණ්ඩල පුහුණුව, තරුණ බලගැන්වීමේ වැඩසටහන, ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ, දිස්ත්‍රික් පාසල් ක්‍රිකට් සංවර්ධන වැඩසටහන	19,553,163.94	19,553,163.94	9,386,091.36	48

20.	198	වාරිමාර්ග අමාත්‍යාංශය	ගමන්, සන්නිවේදනය සහ අනෙකුත් පුනරාවර්තන, වාහන අලුත්වැඩියාව, යෝධ වැව නඩත්තු කිරීම	1,801,065.00	1,801,065.00	1,639,050.39	91
21.	202	මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	ලිපි ද්‍රව්‍ය	5,000.00	5,000.00	5,000.00	100
22.	203	ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව	ලිපිද්‍රව්‍ය සහ මධු වන්දනා මන්දිරය ඉදිකිරීම	5,006,000.00	5,006,000.00	4,775,624.32	95.40
23.	206	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	කලාකරු සුවදම්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය සාහිත්‍ය උළෙල, දොළොස්මහේ පහන, දුප්පත් කලාකරුවන් සඳහා දීමනා, කලාභූෂණ සම්මාන උළෙල, ප්‍රගති රැස්වීම සහ අනෙකුත් පුනරාවර්තන	659,500.00	659,500.00	610,333.17	92.54
24.	210	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	වැටුප්, සන්නිවේදනය සහ අනෙකුත් පුනරාවර්තන	59,800.00	59,800.00	54,494.62	91.13
25.	216	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	වැටුප් සහ අනෙකුත් පුනරාවර්තන, CBR ජාතික වැඩසටහන, ආබාධිතයන් සඳහා ජාතික ක්‍රීඩා තරගාවලිය	7,214,955.00	7,214,955.00	7,126,915.58	98.78
26.	217	පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව	ළමා සභා, දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම, ළමා ගැටළු අවම කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්, නිවුන් ආධාර, ලෝක ළමා දින වැඩසටහන, සත්කාර සැලැස්ම ක්‍රියාත්මක කිරීම, වෛද්‍ය / පෝෂණ ආධාර සහ අනෙකුත් පුනරාවර්තන	623,600.00	623,600.00	609,041.97	97.67
27.	219	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	ගමන් වියදම්, ලිපිද්‍රව්‍ය	92,953.00	92,953.00	50,953.00	54.82

28.	226	ආගමන හා විගමන දෙපාර්තමේන්තුව	මාර්ගගත විදෙස් ගමන් බලපත්‍ර අයදුම්පත් සඳහා දිරි දීමනා	3,000.00	3,000.00	-	-
29.	227	පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව	වැටුප් සහ අනෙකුත් පුනරාවර්තන	6,758,880.19	6,758,880.19	6,155,853.35	91.08
30.	243	සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව	රජයේ ගබඩාවේ මෙහෙයුම් වියදම්	3,000,000.00	3,000,000.00	2,894,197.68	96.47
31.	252	ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව	ගමන් වියදම්, අතිකාල හා නිවාඩු දින වැටුප්, ලිපි ද්‍රව්‍ය, වාහන සේවා, බෝග කැපීම් සහ අනෙකුත් පුනරාවර්තන, ජනගහන සංගණනය, පුහුණු පන්ති, TTO පුහුණු පන්ති	7,062,913.60	7,062,913.60	6,508,237.44	92.15
32.	253	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	සිවිල් විශ්‍රාම වැටුප්, වැ.අ. විශ්‍රාම වැටුප්, අතිකාල, මුද්‍රණය, වෙනත් පුනරාවර්තන	33,362,375.00	33,362,375.00	30,220,724.04	90.58
33.	284	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	වන සතුන්ගේ ප්‍රහාර සඳහා වන්දි	2,317,100.00	2,317,100.00	2,317,100.00	100
34.	286	ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව	වැටුප් සහ වෙනත් වියදම්	1,190,625.00	1,190,625.00	682,500.00	57.32
35.	307	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	අතිකාල සහ නිවාඩු දින වැටුප්, ලිපිද්‍රව්‍ය, සන්නිවේදන, විදුලිය සහ වෙනත් පුනරාවර්තන	1,047,330.00	1,047,330.00	782,106.29	**74.68**
36.	326	ප්‍රජා පාදක නිවැරදි කිරීම් දෙපාර්තමේන්තුව	ගමන් වියදම් හා ලිපිද්‍රව්‍ය	255,000.00	255,000.00	204,556.68	**80.22**

37.	327	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව	ගමන් වියදම් , ලිපි ද්‍රව්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමේ ඉඩම් පරිහරණ කමිටු රැස්වීම්, සංවර්ධන වැඩසටහන	853,500.00	853,500.00	802,716.48	94.05
38.	328	මිනිස් බල හා රැකියා දෙපාර්තමේන්තුව	දිස්ත්‍රික් රැකියා පොළ, ගරු සරු වැඩසටහන, රැකියා සොයන්නන්ගේ වැඩසටහන, උසස් පෙළ සිසුන් සඳහා ප්‍රායෝගික අත්දැකීම් වැඩසටහන, මූලික ආරි වැඩ පන්ති වැඩසටහන, ආබාධ සහිත පුද්ගලයින්ගේ වැඩසටහන, ස්මාර්ට් යෞවන වැඩසටහන, PES මධ්‍යස්ථානයේ පිරිසිදු කිරීමේ සේවා සහ අනෙකුත් පුනරාවර්තන	630,615.00	630,615.00	561,399.33	89.02
එකතුව				**1,226,600,957.93**	**1,226,600,957.93**	**1,073,919,043.16**	**87.55**

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31-12-2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31-12-2024 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි සහ ව්‍යුහයන්	580,745,145.52	580,745,145.52	-	-
9152	යන්ත්‍රෝපකරණ	229,835,947.89	229,835,947.89	-	-
9153	ඉඩම්	29,870,000.00	29,870,000.00	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	0	0	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	0	0	-	-
9160	කෙරීගෙන යන වැඩ	243,971,042.77	243,971,042.77	-	-
9180	බදු දෙන ලද වත්කම්	0	0	-	-
එකතුව		**1,084,422,136.18**	**1,084,422,136.18**	-	-

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

සිංහල පරිවර්තනය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

My No. NPCG/MN/A/DSM/2024 **Your No.** …… **Date: 30th May 2025**

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මන්නාරම

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තන්න්වාගණනය කළ මතය

ශීර්ෂය 265 - මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් ර්වෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ර්වෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් මෙම වාර්තාවේ සඳහන්වේ.. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කර්යාලයට අදාළ වාෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යතා කාලයේ දී නිකුත් කරනු ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව වගණනාධිකාරිගේ වාර්තාව යතා කාලයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබනු ඇත.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මුල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තනන්ත්වාගණනය කළ මනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්වන බලපෑම් හැර, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත
බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශනයක් සැකසීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන 1 වෙත ඔබේ අවධානය යොමු කරමි. මූල්‍ය ප්‍රකාශන රජයේ රෙගුලාසි 150 හා 151 සහා 2025 පෙපරවාර 21 වන දින සංශෝදිත 2024 දෙසැම්බර්16 වන දි රජයේ ගිණුම්කරන මාර්ගොපදේශ අංක 06/2024 ට අනුව මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරය සහ පාර්ලිමේන්තුව භාවිතා කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. ඒ අනුව, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැකිය. මගේ වාර්තාව මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරය සහ පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමණු කොට ඇත. මේ කරුණු සම්බන්ධයෙන් මගේ මතය වෙනස් නොවේ.

1.4 මුල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ රෙගුලාසි 150 හා 151 සහා 2025 පෙපරවාර 21 වන දින සංශොදිත 2024 දෙසැම්බර්16 වන දි රජයේ ගිණුම්කරන මාර්ගොපදේශ අංක 06/2024 ට අනුව ප්‍රමාණාත්මක සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාතා පවත්වා ගෙන යා යුතුය

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාගැනීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතය

1.6.1 මූල්‍ය නොවන වත්කම්

පහත කරුණු නිරීක්ෂණය කරන ලදී.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන වත්කම් ප්‍රතිසංස්කරණය සහ වැඩිදියුණු කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 විසින් එකතුව රු. 6,105,123 ක්, මූල්‍ය නොවන වත්කම් ලෙස දක්වා නොතිබුණි, එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු. 6,105,123 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු විදුලි ජනක යන්ත්‍ර 05 න් රු. 7,236,000 ක් වටිනා විදුලි ජනක යන්ත්‍රයක් සහ වටිනාකම තක්සේරු නොකළ විදුලි ජනක යන්ත්‍රයක් වත්කම් ගිණුමට ඇතුළත් කර නොතිබූ බැවින් මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2021 දී අනතුරකට ලක්ව අලුත්වැඩියා කර භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවති වාහනයක් සමාලෝචිත වර්ෂයේදී 4,950,000 ක සම්පූර්ණ රක්ෂණ මුදල එකතු කර තිබුණද, එහි පොත් වටිනාකම පොතෙන් ඉවත්නොකිරීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම එම මුදලින් වැඩිවී තිබුනි

2. <u>වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව</u>

2018 අංක 19 දරන ජාතික පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ශය සමග අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිලිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේදයේ අදාලත්ය	**විගණන නිරීක්ෂණ**	**නිර්දේශ**
1.6.1.1(ආ)	මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වර්ග අඩි 2625 කින් යුක්ත ඉඩමහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත නොකිරීමෙන් මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම අඩුවෙන් දක්වා තිබුනි.	ඉඩමහි වටිනාකම තක්සේරු කර ගිණුම්වල ඇතුලත් කිරීමට කටයුතු කල යුතුයෙ.

3. මූල්‍ය සමාලොචනය

3.1 ව්‍යදම් කළමනාකරණය

පහත සඳහන් කරුණු අනාවරනය විය

(අ) සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැය විෂයන් 39 ක වෙන් කල ප්‍රතිපාදන එකතුව රු 38,770,149 ක සියයට 11 සිට සියයට 100 ක් දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුනි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාරු කිරීමට අදාලව වැය විෂයන් 7 කට එකතුව රු 12,323,000ක් වෙනත් වැය විෂයන්වලින් මාරු කර තිබුනද එම සමස්ථ ප්‍රතිපධන එකතුව 33,119,381 ක් සියයට 7 සිට සියයට 27 ක් දක්වා පරාසයක ඉතිරිවීම් පැවතීම ඉතිරිවීම පැවතුනි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාරු කිරීමට අදාලව වැය විෂයන් 5 කට එකතුව රු 10,823,000ක් මාරු කිරීමට අදාලව මාරු කර තිබුනද එය භාවිතා නොකර එකතුව 5,833,922 ඉතිරිවීම පැවතුනි. මේ අනුව අදාල මාරුකිරීම අවශ්‍යතාවය අනකූලව කාර්යක්ෂමව ලෙස උපයෝජනය කර නොතිබුනි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්දන වියදම් වැඩ සඳහා වත ඇස්තමේන්තුවේ පරිපාලන වැය සඳහා රු 212,828 ක් වෙන්තර තිබුනද එම වැය සඳහා රු 319,416 ක් භාවිතා නොකරීම හේතුවේන රු 107,588 ක් ප්‍රතිපාධනයට අමතරව වැය කර තිබුනි.

3.2 බැරකම් හා බැදීම්වලට එලබීම

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන ගිණුම් වාර්තා සැකසිම සම්බන්ධ මාර්ගෝපදේශ 03 හි 3.3 ඡේදයට ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 දිනට වාර්තා කරන ආයතනවල බැරකම් හා බැදීම් අංකයට අනුකූලව හෙළිදරව් කළ යුතුය, කෙසේ වෙතත්, සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ වගකීම් සහ බැඳීම් වාර්තාවේ රු 1,482,101 ක් ඇතුලත්තර නොතිබුනි.

3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

3.3.1 පුනරාවර්තන වියදම්

(අ) 2024 වර්ෂයේ වියදම් වාර්තාව ප්‍රකාරව අමාත්‍යාංශ 17 ක් හා දෙපාර්තමේන්තු 12ක් යනුවෙන් පුනරාවරතන වැය විෂයන් 65ක් යටතේ ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදන අදාල අරමුණු සඳහා උපයොජනය කිරීමෙන් තොරව එම මූල්‍ය ප්‍රතිපාදනයේ සියයට 10 සිට සියයට 88 දක්ව පරාසයකින් එකතුව 11,700,983ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුනි. මෙය කාර්යක්ෂම නොවන කළමනාකරණ ක්‍රියාවත් වන්නේය.

(ආ) 2024 වර්ෂයේ වියදම් වාර්තාව ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ 2 ක් හා දෙපාර්තමේන්තු 5ක් යනුවේන පුනරාවරතන වැය විෂයන් 10 ක් යටතේ ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදන අදාල අරමුණු සඳහා උපයොජනය කිරීමේන තොරව එම මූල්‍ය ප්‍රතිපාදනයේ සියයට 100 දක්ව පරාසයකින් එකතුව 360,296ක් ප්‍රතිපාදන ඉතිරි කර තිබුනි.

3.3.2. ප්‍රාග්ධන වියදම්

සමාලෝචිත වර්ෂයේ වර්ෂයේ අමාත්‍යාංශ 9 කින් ප්‍රාග්ධන වියදම් යටතේ ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදන එකතුව රු 127,960,849ක් සියයට 10 සිට සියයට 90 දක්ව පරාසයකින් ඉතිරි කර තිබුනි

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරනවලට අනුකූල නොවීමේ අවස්තා පහත සඳහන්වේ

අංක	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරන සඳහාවන අනුකූලනය	වටිනාකම	අනුකූල නොවීම.
(අ)	වෙනත් රෙගුලාසි හා මාර්ගොපදේශ	805,120	දිස්ත්‍රක් ලේකම්ට පුනරාවතන වියදම් සඳහා සෘජු මිලදී ගැනීමක සීමාව රු 200,000 යනුවෙන් තිබියදී අවස්තා දෙකකදී එකතුව රු 805,120 ක සෘජු මිලදී ගැනීම් සිදුකර තිබීම
	2006 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 3.5		

3.5 තැන්පතු ගිණුම් ශේෂ

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තැන්පතු 13ක හා මුසලි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තැන්පතු 8 ක එනම් තැන්පතු 21ක එකතුව 3,116,513ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ක්‍රියාමාර්ග නොගෙන පසුගිය වසර 02කට අධික කාලයක් පොදු තැම්පත් ගිණුමේ රඳවා තිබුනි.

4. මෙහෙයුම් සමාලෝචන

4.1 ක්‍රියාකිරීම

4.1.1 ආප්තකෂිත ප්‍රතිඵල ලබාගත නොහැකිවීම.

(අ) ගොවිජන අමාත්‍යාංශය

i. ගොවිජන අමාත්‍යාංශය මගින් බිම්මල් ව්‍යාපෘති සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට රු 2,577,060 ක ප්‍රතිපාදන වෙන් කල තිබුනි. මේ සඳහා මන්නාරම් දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5 කින් ප්‍රතිලාබීන් 20ක් තෝරගෙන යුතුව තිබිය දී ප්‍රතිලාබීන් 15ක් පමණක් තෝරාගෙන තිබුනි. එබැවින් ප්‍රතිලාබීන් 5ක් සඳහාවන ප්‍රතිපාදන මුදල රු 644.265ක් ඉතිරව තිබුණි.

ii. ඉහල ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාබීන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීම යන ප්‍රධාන ඉලක්ක සපුරා නොතිබුනි. තවද ශක්‍යතා පරීක්ෂණ, නිසි දැනුවත්කිරීම්, අලවි කිරීමේ පහසුකම් නොතිබීම යන හේතූන් නිසා අපේක්ෂිත ප්‍රතිලාබීන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීමේ ඉලක්ක සපුරා ගැනීමට නොහැකිව අසාර්තක ව්‍යාපෘතියක් ලෙස තිබුනි.

ආ) කටුක්කරෙයි වැව් ව්‍යාපෘති මට්ටමේ කෘෂිකාර්මික සංවිධානය

(i) කටුක්කරෙයි වැව් ව්‍යාපෘති මට්ටමේ කෘෂිකාර්මික සංවිධානය 2018 සිට ක්‍රියාත්මක වුවද, 2010 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 43(2) වගන්තිය අනුව එය ලියාපදිංචි කර නොතිබුනි.

(ii) ඉහත සංවිධානය සඳහා ලියාපදිංචියක් නොමැති විට, 2021, 2022 සහ 2023 වර්ෂවල ව්‍යාපෘති කළමනාකරණ කමිටු රැස්වීමේ යෝජනාවට අනුව නොකර වාර්ෂිකව වෙන් කරන ලද කුඹුරු ඉඩම් සහ අතිරේක බෙදා හරින ලද කුඹුරු 2021 සිට 2023 දක්වා වන කාලසීමාව තුල රිසිටපත් නොමරතිව වෙන්දේසි කිරීමෙන් ගොවීන්ගෙන් එකතු කරන ලද එකතුව රු 9,729,549 ක මුළු ආදායම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි අංක 178(1) ප්‍රකාරව අක්‍රමවත් ආදායම් එකතු කිරීමකි.

(iii) ඉහත සං කටුක්කරෙයි වැව් ව්‍යාපෘති මට්ටමේ කෘෂිකාර්මික සංවිධානය මගින් එකතු කරන ලද මහජන අරමුදල්වලින් රජයේ දෙපාර්තමේන්තුවල සේවය කර විශ්‍රාම ගිය හා ස්ථාන මාරු වූ විධායක නිලධාරීන් දෙදෙනෙකු සඳහා පැවැත්නු සමුදීමේ උත්සව සහ එම නිලධාරීන්ට ලබා දුන් තෑගය සඳහා වැය කරන ලද එකතුව රු 567,105ක මුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 3.5 වගන්තියටව තිබේ.

(iv) ඉහත සංවිධානය 2022 දී ව්‍යාපෘති කළමනාකරු කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු. 354,603 ක ගෙවීමක් කර තිබුණද, එම කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳ කිසිදු සාක්ෂියක් නොතිබුනි.

(ඇ). නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

මන්නායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රදේශවල වසර 2016 සිට වසර 2023 දක්වා කාලය තුල නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් නිවාස 24 ක් ඉදිකර ලබා දී තිබුණද, ඒවා වාසය නොකරන හා භාවිතයට නොගත් නිවාස ලෙස තිබීම හේතුවෙන් එකතුව රු. 19,600,000 ක රජයේ මුදල් අකාර්යක්ෂම ලෙස භාවිතා කර ඇත.

4.1.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය

දිස්ත්‍රික් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මීමැසි පාලන ව්‍යාපෘතිය සඳහා රු. 2,428,300 ක මූල්‍ය ප්‍රතිපාදනයක් ඉල්ලා එය ලැබී තිබුණද, ඒ සඳහා ශක්‍යතා අධ්‍යයනය සහ දැනුවත් කිරීමේ සහ සොයාබැලීම් යන කටයුතු දිස්ත්‍රික් කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් ඵලදායී ලෙස සිදු නොකළ අතර, එම නිසා මූල්‍ය ප්‍රතිපාදනය 2023 දෙසැම්බර් 31 දින කල් ඉකුත් වී ආපසු හරවායවා ඇත.

4.2 වත්කම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංගණන මණ්ඩල වාර්තාවට අනුව, පෞද්ගලික සහ රාජ්‍ය නොවන සංවිධානයක් විසින් සපයන ලද විවිධ ප්‍රාග්ධන භාණ්ඩ අයිතම 33 ක් තක්සේරු කර ගිණුම්වලට ඇතුළත් කර නොතිබුනි.

4.3 පාඩු සහ හානි

සමාලෝචිත වර්ෂය තුළ, අනතුරුවලට ලක් වූ වාහන 02 ක් සඳහා වූ පාඩු අයකර ගෙන නොතිබුනි.

4.3 කළමනාකරණ දුර්වලතා

(අ) සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සිමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක භාණ්ඩ වර්ග 63 ක අයිතම 414 ක් ඉන්වෙන්ටරි ලේඛනයේ සටහන් කර නොතිබුනි.

(ආ) සමෘධි සහනාධාර ණය ලබාගෙන තිබූ සාමාජිකයන් සම්බන්ධයෙන් මාස 09 කට වැඩි කාලයක් මාසික ණය වාරික ගෙවා නොමැති සහ අයකර ගත නොහැකි ණය ලෙස සැලකෙන සාමාජිකයින් 442 දෙනෙකුගේ හිඟ ණය ශේෂය එකතුව රු. 35,626,602 ක මුදල අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැතිව තිබුනි.

5. මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂය අවසන් වන විට, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පුරප්පාඩු 98 ක් සහ අතිරික්ත කාර්ය මණ්ඩලය 02 ක් තිබුනි.

ජේ.ඒ.එස්. ධම්මික පෙරේරා.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති (NPCG)

විගණකාධිපති වෙනුවට

4. 04 වන පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තථ්‍ය නිමැවුම		
	90%-100%	75%-89%	50%-74%
ඉඩම් බලපත්‍ර	-	78%	-
උප්පැන්න සහතික, මරණ සහතික, විවාහ සහතික	101%	-	-
වාහන ආදායම් බලපත්‍ර	97%	-	-
ජාතික හැඳුනුම්පත්	90%	-	-
ව්‍යාපාර ලියාපදිංචිය	122%	-	-

5. 05 වන පරිච්ඡේදය – තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න



දරිද්‍රතාවය තුරන් කිරීම

සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම යනු මානව වර්ගයා විසින් මුහුණ දෙනු ලබන එක් විශාලතම අභියෝගයක් ලෙස ඉතිරිව පවතී. වර්ෂ 1990 සිට 2015 දක්වා කාලය තුලදී ලෝකයේ වෙසෙන අන්ත දිළිදු ජනගහනය සංඛ්‍යාත්මකව හරි අඩකට වඩා පහළ ගියද තවමත් විශාල ජනකායක් ස්වකීය මූලික අවශ්‍යතා සපුරාගත නොහැකිව දුෂ්කරතාවයට පත්ව සිටිති. වර්ෂ 2030 දී සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීමේ අරමුණ සපුරා ගැනීම සඳහා තිරසර සංවර්ධන අරමුණු වෙත විශාල වශකීමක් පැවරී ඇත. මෙහිදී වඩාත් අනතුරට ලක්විය හැකි පාර්ශව, මූලික පහසුකම් හා සේවාවන් වර්ධනය කිරීම සහ ගැටුම් වලින් හා කාලගුණ තත්ව හේතුවෙන් ඇතිවන විපත්වලින් බලපෑමට ලක්වූ ප්‍රජාවන් වෙත ආධාර කිරීම කිරීම ඉලක්ක කර ඇත.

ඉලක්ක අංකය	ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
				0% - 49%	50% - 74%	75%- 100%
	දුප්පත්කම අවම කිරීම	ජීවන තත්වය වැඩිදියුණු කිරීම	ස්ථාපිත කර ඇති ආහාර මධ්‍යස්ථාන 24 න් 15 කින් දරිද්‍රතාවයෙන් 12,334 පෙළෙන ප්‍රතිලාභීන්ට වියළි සලාක ලබා දීම	-	-	100%
			රුපියල් මිලියන 395.27 ක වටිනාකමකින් යුත් විමධ්‍යගත අයවැය සැලැස්ම, ග්‍රාමීය සංවර්ධන සැලැස්ම සහ දිස්ත්‍රික් සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කර ඇත.	-	-	100%

			කාර්යාල ප්‍රතිසංස්කරණය සහ තොරතුරු තාක්ෂණ උද්‍යාන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු රුපියල් මිලියන 130.04 ක වියදමින් නිම කර ඇත. ගැබිනි මව්වරුන් 643 දෙනෙකුට රුපියල් මිලියන 76.67 ක් ගෙවා ඇත. ආබාධිත සහ වකුගඩු රෝගයෙන් පීඩාවට පත් වූවන් සඳහා රුපියල් මිලියන 255.60 ක් ලබා දී ඇත.	-	-	100%
			ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 5 කින් තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් 30425 ක් සඳහා රුපියල් මිලියන 118.47 ක වියදමින් සහල් ලබා දී ඇත	-	-	100%



දැරිය හැකි සහ පවිත්‍ර බලශක්තිය

ජනගහනය වර්ධනය වීම මේ දක්වාම සිදුවන හෙයින් ලාභදායී බලශක්තිය සඳහා වන ඉල්ලුම සහ ෆොසිල ඉන්ධන මත පදනම්වූ ආර්ථිකයක් පැවතීම හේතුවෙන් අපගේ දේශගුණ තත්වයන්හි ප්‍රභල විපර්යාසයන් නිර්මාණය වෙමින් පවතී. වර්ෂ 2030 වන විට තිරසර සංවර්ධන ඉලක්ක අංක සාක්ෂාත් කරගැනීමට නම් සූර්ය, සුළං සහ තාප බලශක්තිය යනාදිය සඳහා ආයෝජනය, බලශක්ති ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සහ සැමට බලශක්තිය ලැබීම සහතික කිරීම යන කරුණු ඉතා වැදගත් වේ. සෑම රාජ්‍යයකම පිරිසිදු සහ වඩාත් කාර්යක්ෂම බලශක්තිය සැපයීම සඳහා යටිතල පහසුකම් පුළුල් කිරීම සහ තාක්ෂණය උසස් කිරීම මඟින් දියුණුව සඳහා අනුබල දීම සහ පරිසරය සුරැකීම.

ඉලක්ක අංකය	ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
				0% - 49%	50% - 74%	75%- 100%
	දැරිය හැකි සහ පවිත්‍ර ඉන්ධන	අපගේ අවශ්‍යතා සඳහා වන දැරිය හැකි මිලකට, විශ්වාසනීය සහ නවීන බලශක්ති සේවා වෙත ප්‍රවේශය තහවුරු කිරීම. දැරිය හැකි මිලකට, විශ්වාසනීය සහ නවීන බලශක්ති සේවා වෙත විශ්වීය ප්‍රවේශය තහවුරු කිරීම.	අපේ දිස්ත්‍රික්කයේ අභ්‍යන්තරව අවතැන් වූ පවුල් 240 කට නොමිලේ විදුලි සම්බන්ධතාවයක් සහ අභ්‍යන්තරව අවතැන් වූ පවුල් 156 කට නොමිලේ ජල සම්බන්ධතාවයක් ලබා දී ඇත. “නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ මූල්‍ය ආධාර යටතේ රු. මිලියන 14.45 ක් වැය කර ඇත.	-	-	100%



නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම

නගරයන්හි ශීඝ්‍ර වර්ධනය ඉහල යන ජනගහනය සහ අධික සංක්‍රමණයන්ගේ ප්‍රතිඵලයක් වන අතර එය මහා නගර බිහිවීමට හේතුවී ඇත. එහිදී විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින ලෝකයේ මුඩුක්කු ජනාවාස නාගරික ජීවිතයේ සැලකිය යුතු අංගයක් බවට පත්ව තිබේ.

තිරසර ලෙස නගර සකස් කිරීම යනු වෘත්තීය සහ ව්‍යාපාර අවස්ථා නිර්මාණය කිරීම, දැරිය හැකි මිලකට ආරක්ෂාකාරී නිවාස සැපයීම සහ ශක්තිමත් සමාජයන් හා ආර්ථිකයක් ගොඩනැගීමයි. එහිදී පොදු ප්‍රවාහනය හා හරිත පොදු අවකාශ නිර්මාණය සඳහා ආයෝජන කිරීම සහ සහභාගීත්ව හා පරිපූර්ණ ලෙස නගර සැලසුම් වැඩිදියුණු කිරීම සහ කළමනාකරණයද ඇතුලත්වේ.

ඉලක්ක අංකය	ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
				0% - 49%	50% - 74%	75%- 100%
	තිරසර නගර සහ ප්‍රජාවන්	සැමටම ප්‍රමාණවත්, ආරක්ෂිත හා දැරිය හැකි මිලකට නිවාස පහසුකම් ලබාගැනීමේ ප්‍රවේශයන් සහතික කිරීම.	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන මත රුපියල් මිලියන 42.84 ක වියදමින් රුපියල් මිලියන 0.6 ක් වටිනා නිවාස 39 ක් සහ රුපියල් මිලියන 1 ක් වටිනා නිවාස 37 ක් ඉදිකරන ලදී.	-	-	100%

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග



අපේ දිස්ත්‍රික්කයේ ප්‍රමාණවත් මානව සම්පත්, මූල්‍ය හා භෞතික සම්පත් ප්‍රමාණවත් නොවේ. මේවා අපගේ ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා වඩාත්ම වැදගත් කොටසයි. අනාගතය පුරෝකථනය කළ නොහැකි වුවද, තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සපුරාලීමේ අපගේ හැකියාවට බලපාන ආර්ථික හා සමාජීය අංශ කිහිපයක් පිළිබඳ පැහැදිලි මඟ පෙන්වීම් තිබේ. නිශ්චිත ව්‍යාපෘති කාල සීමාව තුළ ක්‍රියාත්මක කරන ලද මෙම විශේෂිත ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභීන් විසින් පහත සඳහන් ප්‍රතිලාභ භාවිතා කරන ලදී. රැකියා අවස්ථා සහ ආදායම් වැඩි කිරීම, දරිද්‍රතාවය අඩු කිරීම, ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සහ අභ්‍යන්තර මාර්ග සහ පොදු ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම. ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා නිකුත් කරන ලද ජීවනෝපාය අයිතම සහ ණය.



සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස, ශ්‍රී ලංකාව තුළ විදුලිය සඳහා ඇති ඉල්ලුම අඛණ්ඩව ඉහළ යනු ඇත. වාසනාවකට මෙන්, රට තුළ බහුල පුනර්ජනනීය බලශක්ති විභවයක් ඇත. පුනර්ජනනීය බලශක්තියට මාරුවීම රජයේ මූල්‍ය මත බරක් වන ඉන්ධන ආනයන අඩු කිරීමට, කාන්තාවන් ඇතුළු රැකියා නිර්මාණය කිරීමට සහ පිරිසිදු හා දැරිය හැකි බලශක්තිය මත පදනම්ව ආර්ථිකය නැවත ගොඩනැගීමට අවස්ථාවක් සපයයි. මෙම සංක්‍රාන්තිය ආර්ථිකයට, බලශක්ති කර්මාන්තයට සහ පරිසරයට බහුවිධ වාසි ඇති කරනු ඇත. සාමාන්‍යයෙන්, ජනගහනය අඛණ්ඩව වර්ධනය වන බැවින්, එය ලාභ බලශක්තිය සඳහා ඇති ඉල්ලුම වනු ඇත. සූර්ය, සුළං සහ තාප බලශක්තිය සඳහා ආයෝජනය කිරීම බලශක්ති ඵලදායිතාව වැඩි දියුණු කිරීම සෑමට බලශක්තියට උපකාරී වේ.



අපේ මන්නාරම දිස්ත්‍රික්කය සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා බොහෝ විභවයන් ඇත. සංචාරක අමාත්‍යාංශයේ මූල්‍ය සහයෝගය ඇතිව මන්නාරම කොටුව, ඩොරික් බංගලාව සහ අනෙකුත් සංචාරක ස්ථාන ප්‍රතිසංස්කරණය කර තලෙයිමන්නාරම සිට රාමේෂ්වරම් දක්වා තොටුපළ සේවාව නැවත ආරම්භ කළ යුතුය. එය මන්නාරම සංචාරක සංවර්ධනය සඳහා රැකියා අවස්ථා සහාය ලබා දෙනු ඇත.

6. 06 වන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	35	26	09
තෘතීයික	19	05	14
ද්විතීයික	545	507	38
ප්‍රාථමික	69	34	35
එකතුව	**668**	**572**	**96**

6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා 02 ක් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පහ සඳහා 05 ක් ලෙස කාර්මික නිලධාරී තනතුරු 07 ක් අනුමත කර තිබුණද දැනට එම තනතුරේ නිලධාරීන් කිසිවකු අනුයුක්ත කොට නොමැත. එම නිසා ඇස්තමේන්තු සකස් කිරීම, වැඩ අධීක්ෂණය, ටෙන්ඩර් පටිපාටි සහ බිල්පත් පරීක්ෂා කිරීම ආදී සියළු කටයුතු තාක්ෂණ සහකරුවන් සහය ඇතිව එක් දිස්ත්‍රික් ඉංජිනේරුවරයා විසින් සිදුකරනු ලබයි. මේ හේතුවෙන් එක් එක් සංවර්ධන ව්‍යාපෘතියක්ම නියමිත කාලරාමුව තුලදී නිරීක්ෂණය හා ක්‍රියාත්මක කිරීමේදී විශාල වැඩකොටසක් එක්රැස්වී ඇත.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා සිංහල - දෙමළ භාෂා පරිවර්ථක තනතුරු 06 ක් අනුමත කර තිබුණද මේ දක්වා භාෂා පරිවර්ථක තනතුරේ නිලධාරීන් කිසිවකු අනුයුක්ත කොට නොමැත. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පහක කාර්ය සාධනය සහ ඵලදායීතාව වර්ධනය සඳහා සිංහල - දෙමළ භාෂා පරිවර්ථකයින් අවශ්‍ය වන අතර එය සේවාලාභීන්ගේ තෘප්තියට රැකුලක් වනු ඇත.

- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පහ සඳහා කාර්යාල සේවක සේවයේ තනතුරු 48 ක් අනුමත කර තිබුනද 2024 වර්ෂයේදී මෙම තනතුරේ සේවකයින් 22 දෙනකු පමණක් අනුයුක්ත කර සිටී. මෙය අනුමත සංඛ්‍යාවෙන් අඩකටත් වඩා අඩු ප්‍රමාණයකි. මෙම නිසා දෙවන පෙල නිලධාරීන් දුෂ්කරතාවයන්ට මුහුණ දෙන අතරම මෙම තත්වය කාර්යක්ෂම සේවාවන් සැලසීමේලා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පහට අභියෝගයක්ව ඇත.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 145 ක් අනුමත කර තිබුනද දැනට අනුයුක්ත කර සිටින්නේ නිලධාරීන් 79 ක් පමණි. යහපත් රාජ්‍ය සේවයක් ලබාදීම සඳහා කළමනාකරණ ක්‍රියාකාරකම්වලට සහය වීමට කළමනාකරණ සේවා නිලධාරීගේ සේවය අත්‍යවශ්‍ය වේ.

- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරී වසම් සඳහා සංවර්ධන නිලධාරී සේවයේ තනතුරු 213 ක් අනුමත කර තිබුනද දැනට සංවර්ධන නිලධාරීන් 273 දෙනකු සේවයට අනුයුක්ත කර ඇත. මෙම නිසා කාර්යාල උපකරණ සහ අනෙකුත් පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් දෛනික කටයුතුවලදී දුෂ්කරතා මතුව ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු '000)		වැඩ සටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
SYSCGAA 2.0 පුහුණු වැඩසටහන	40	පැය 4 යි	7,400.00	-	දේශීය	නව අනුවාදයේ SYSCGAA ප්‍රවේශ ක්‍රියා පටිපාටිය පිළිබඳ දැනුම දැනුම වර්ධනය
SYSCGAA 2.0 පුහුණු වැඩසටහන ඉදිරි වැඩසටහන, Adv Pro, නිවාඩු කළමනාකරණය සහ E. තැපැල්	32	දින 1 යි	22,730.00	-	දේශීය	SYSCGAA ඉදිරි වැඩසටහන, නිවාඩු කළමනාකරණය සහ E.Post පිළිබඳ පිළිබඳ දැනුම වර්ධනය
පැය 150 සිංහල පන්තිය	67	පැය 150 යි	112,500.00	-	දේශීය	සිංහල භාෂාව දියුණු කිරීම.
අලුතින් පත් කරන ලද ග්‍රාම නිලධාරීවරුන් සඳහා පුහුණුව	32	දින 25 යි	245,003.00	-	දේශීය	විෂය දැණුම වර්ධනය විය
පැය 150 සිංහල පන්තිය	60	පැය 150 යි	112,500.00	-	දේශීය	සිංහල භාෂාව දියුණු කිරීම.
SYSCGAA 2.0 පුහුණු වැඩසටහන E. තැපැල්	50	පැය 3 යි	11,360.00	-	දේශීය	විෂය දැණුම වර්ධනය විය
පැය 150 සිංහල පන්තිය	68	පැය 150 යි	112,500.00	-	දේශීය	සිංහල භාෂාව දියුණු කිරීම.
SYSCGAA 2.0 පුහුණු වැඩසටහන - CBAS Cloud පැමිණීමේ පද්ධතිය	45	පැය 3 යි	13,430.00	-	දේශීය	විෂය දැණුම වර්ධනය විය

පැය 150 සිංහල පන්තිය	60	පැය 150 යි	112,500.00	-	දේශීය	සිංහල භාෂාව දියුණු කිරීම.
පැය 150 සිංහල පන්තිය	32	පැය 150 යි	112,500.00	-	දේශීය	සිංහල භාෂාව දියුණු කිරීම.
මූල්‍ය නියාමනය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම	65	දින 1 යි	15,650.00	-	දේශීය	විෂය දැණුම වර්ධනය විය
පරිපාලන නියාමනය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම	75	දින 1 යි	7,580.00	-	දේශීය	විෂය දැණුම වර්ධනය විය
තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහන	30	දින 1 යි	9,200.00	-	දේශීය	විෂය දැණුම වර්ධනය විය
අලුතින් පත් කරන ලද ග්‍රාම නිලධාරීවරුන් හඳුන්වාදීම සඳහා පුහුණු වැඩසටහන	10	දින 1 යි	166,530.00	-	දේශීය	විෂය දැණුම වර්ධනය විය
විනය ක්‍රියාමාර්ග සඳහා පුහුණු වැඩසටහන	60	දින 1 යි	50,850.00	-	දේශීය	විෂය දැණුම වර්ධනය විය
ගිණුම්කරණ පද්ධතියේ දැනුම වැඩි දියුණු කිරීම	30	දින 3 යි	11,340.00	-	දේශීය	විෂය දැණුම වර්ධනය විය
ඵලදායිතා පුහුණු වැඩසටහන	100	දින 2 යි	39,010.00	-	දේශීය	විෂය දැණුම වර්ධනය විය
උපදේශන පුහුණු වැඩසටහන	50	දින 1 යි	15,450.00	-	දේශීය	විෂය දැණුම වර්ධනය විය
ඵලදායිතා පුහුණු වැඩසටහන	53	දින 3 යි	62,695.00	-	දේශීය	විෂය දැණුම වර්ධනය විය

ඵලදායිතා පුහුණු වැඩසටහන	74	දින 1 යි	64,750.00	-	දේශීය	විෂය දැණුම වර්ධනය විය
මිනින්දෝරු කඳවුර	08	දින 4 යි	59,000.00	-	දේශීය	විෂය දැණුම වර්ධනය විය - GPS තාක්ෂණය සඳහා මැනුම්, මට්ටම් කිරීමේ සහ සිතියම්කරණ යෙදුම
ඵලදායිතා පුහුණු වැඩසටහන	30	දින 1 යි	24,135.00	-	දේශීය	විෂය දැණුම වර්ධනය විය
අභිප්‍රේරණ පුහුණුව	150	පැය 6 යි	54,400.00	-	දේශීය	සේවක නියුක්තිය සහ රැකියා තෘප්තිය වැඩි වීම
තොරතුරු තාක්ෂණ පුහුණුව	50	දින 1 යි	27,900.00	-	දේශීය	Google පත්‍ර යාවත්කාලීන කිරීමේ සහ තාක්ෂණය සමඟ වැඩ කිරීමේ කුසලතාව වැඩි දියුණු කිරීම.
EDO සඳහා තාක්ෂණික අධීක්ෂණය	50	පැය 6 යි	12,300.00	-	දේශීය	ග්‍රාම නිලධාරී අංශයේ සංවර්ධන කටයුතු අධීක්ෂණය කරන ආකාරය වැඩිදියුණු කළ කුසලතා
ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ පුහුණුව	60	පැය 6 යි	40,800.00	-	දේශීය	විෂය දැණුම වර්ධනය විය
එකතුව			**1,524,013.00**			

7. 07 වන පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම	අදාල නොවේ	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නොවේ	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නොවේ	-	-
1.6	වෙනත්	අදාල නොවේ	-	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම** (**මු.රෙ.** 445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම** (**මු.රෙ.** 135)			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014-05-11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ	-	-

4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීම	අනුකූල නොවේ	දත්ත රැස් කිරීමේ ප්‍රමාදය	ඉදිරියේදී මෙවන් ප්‍රමාදයන් වලක්වා ගන්නා ලෙසට අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදී තිබේ.
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ	-	-
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරන විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	-	-
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය, ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
8.4	වාර්ෂිකභාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ	-	-
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ	-	-

9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ	-	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ	-	-
9.5	2016-12-29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල නොවේ	වාහන 2ක් අලුත්වැඩියා කරමින් පවතින ගරාජයේ ඇත.	අනාගතයේදී පියවර ගෙන තිබුණි
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල නොවේ	ලීසිං සමාගමෙන් ලීසිං සම්පූර්ණ ලිපිය ලැබීමේ ප්‍රමාදය.	හිමිකාරිත්වය පැවරීමට ගත් ක්‍රියාමාර්ගය
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අදාල නොවේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයත් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	අදාල නිලධාරියාට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු සිදුවේ.	ඉදිරියේදී මෙවන් දෝෂයන් වලක්වා ගන්නා ලෙසට අදාල නිලධාරීන්ට තදින්ම උපදෙස් ලබාදී තිබේ. අභ්‍යන්තර පරීක්ෂා කිරීම් සහ අභ්‍යන්තර පාලනය තදින්ම ක්‍රියාත්මක කර ඇත.
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ	-	-
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලැඹීම	අනුකූල වේ	-	-
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ	-	-
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ නිල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	සේවය අත්හැර යාම සහ වැඩ තහනම් කිරීම	ඇපකර මගින් අයකර ගැනීමට පියවර ගෙන ඇත.
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-

14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ	-	-
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ	-	-
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ	-	-
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයාට වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල නොවේ	සංවර්ධන නිලධාරීන්ගේ සැබෑ සේවක සංඛ්‍යාව අනුමත සේවක සංඛ්‍යාවට වඩා වැඩිය.	කළමනාකරණ සේවා නිලධාරීන් නොමැතිකම හේතුවෙන් අනුමත කාර්ය මණ්ඩලය වැඩි කිරීමට පියවර ගැනීම.
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ	-	-
16.3	20-09-2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ	-	-
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ	-	-

19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018-01-24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ	-	-
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ	-	-
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ	-	-
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට කර තිබීම.	අනුකූල වේ	-	-